සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය

පරිසර අමාත්‍යාංශය

පුරප්පාඩු

2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ ස්ථාපිත කරන ලද සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයේ පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

රැකියා විස්තරය : 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ අධිකාරියට පැවරී ඇති කාර්යයන් ඉටුකිරීම.

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්) (HM 1-3)- තනතුරු 01

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිසර විද්‍යාව/ධීවර හා සාගර විද්‍යාව/ සමුද්‍රීය සම්පත් කළමනාකරණය /වෙරළ සහ සමුද්‍රීය සම්පත් කළමනාකරණය/පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය/ ව්‍යවහාරික විද්‍යාව/ජීව විද්‍යාව /සත්ව විද්‍යාව සහ ධීවර කටයුතු/ ජෛව තාක්ෂණය/ ජලජ සම්පත් තාක්ෂණය/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමග

පරිසර විද්‍යාව/ධීවර හා සාගර විද්‍යාව/ සමුද්‍රීය සම්පත් කළමනාකරණය /වෙරළ සහ සමුද්‍රීය සම්පත් කළමනාකරණය/පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය/ ව්‍යවහාරික විද්‍යාව/ජීව විද්‍යාව /සත්ව විද්‍යාව සහ ධීවර කටයුතු/ ජෛව තාක්ෂණය/ ජලජ සම්පත් තාක්ෂණය/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකාර මට්ටමේ"** තනතුරක අවම වශයෙන් වසර පහළොව (15) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1) සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර දෙක (02) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස:

අවු: 35 ට නොඅඩු හා අවු: 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

HM 1-3-2025- (රු.152,500-15X4,100-214,000)

2. කළමනාකරු (පළාත්) (HM 1-1)- තනතුරු 01

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිසර විද්‍යාව/ ධීවර හා සාගර විද්‍යාව/ ජීව විද්‍යාව/ භෞතික විද්‍යාව/ රසායන විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමග

ඉහත විෂය ධාරාව යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **කළමනාකරණ මට්ටමේ** තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කළමනාකාර" (MM) සේවා ගණයෙහි I ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර තුන (03)ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමග MM වැටුප් කාණ්ඩයේ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

වයස:

අවු.35 ට නොඅඩු හා අවු.55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

HM 1-2-2025- රු.(140,640-15X4,100-202,140)

3. කළමනාකරු (මෙහෙයුම්) (HM 1-1)- තනතුරු 01

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිසර විද්‍යාව/ධීවර හා සාගර විද්‍යාව/ සමුද්‍රීය සම්පත් කළමනාකරණය /වෙරළ සහ සමුද්‍රීය සම්පත් කළමනාකරණය/පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය/ ව්‍යවහාරික විද්‍යාව/ජීව විද්‍යාව /සත්ව විද්‍යාව සහ ධීවර කටයුතු/ ජෛව තාක්ෂණය/ ජලජ සම්පත් තාක්ෂණය/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

සමග

ඉහත විෂය ධාරාව යටතේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

රජයේ,රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකාර මට්ටමේ"** තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහතුන (13)ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කළමනාකාර" (MM) සේවා ගණයෙහි I ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර තුන (03)ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සමග MM වැටුප් කාණ්ඩයේ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

වයස:

අවු.35 ට නොඅඩු හා අවු.55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

HM 1-1-2025- රු.(140,640-15X4,100-202,140)

4. කළමනාකරු (නීති) (HM 1-1)- තනතුරු 01

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

1. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

සමග

නීති විෂය ධාරාවට අදාළ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

රජයේ,රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකාර මට්ටමේ"** තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කළමනාකාර" (MM) සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර තුන (03) ක නීති අංශයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම සමග MM වැටුප් කාණ්ඩයේ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

වයස:

අවු.35 ට නොඅඩු හා අවු.55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

HM 1-1-2025- රු.(140,640-15X4,100-202,140)

5. කළමනාකරු (සැලසුම්) (HM 1-1)- තනතුරු 01

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආර්ථික විද්‍යාව /ගණිතය /වාණිජ්‍ය/ සංඛ්‍යාතය/ සමුද්‍ර කටයුතු /පරිසර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

සමග

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පිළිගත් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකාර මට්ටමේ"** තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කළමනාකාර" (MM) සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර තුන (03) ක සැලසුම් අංශයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම සමග MM වැටුප් කාණ්ඩයේ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

වයස:

අවු.35 ට නොඅඩු හා අවු.55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

HM 1-1-2025- රු.(140,640-15X4,100-202,140)

6. කළමනාකරු (මුදල්) (HM 1-1)- තනතුරු 01

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් වාණිජ්‍ය, ගණකාධිකරණය, මූල්‍යකරණය, මූල්‍ය කළමනාකරණය හෝ අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ වෙනත් උපාධියක් ලබා තිබීම.

සමග

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකාර මට්ටමේ"** තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ, පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක පූර්ණ සාමාජිකත්වය ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **"කළමනාකාර මට්ටමේ"** තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සඳහන් 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කළමනාකාර" (MM) සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර තුන (03) ක සැලසුම් අංශයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම සමග MM වැටුප් කාණ්ඩයේ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

වයස:

අවු.35 ට නොඅඩු හා අවු.55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

HM 1-1-2025- රු.(140,640-15X4,100-202,140)

07. කළමනාකරු (පාලන හා මානව සම්පත් සංවර්ධන) (HM 1-1)- තනතුරු 01

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ වාණිජ්‍ය හෝ එම විෂය ධාරාව ප්‍රධාන වූ මූලික උපාධියක් තිබීම.

සමග

2. ඉහත විෂය ධාරාව යටතේ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම හෝ ඉහත විෂය ධාරාව යටතේ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබීම.

සහ

රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක **කළමනාකාර මට්ටමේ** තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර දහතුන (13) ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කළමනාකාර" (MM) ගණයෙහි I වන ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර තුන (03)ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම සමග MM වැටුප් කාණ්ඩයේ II වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබීම.

වයස:

අවු.35 ට නොඅඩු හා අවු.55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

HM 1-1-2025- රු.(140,640-15X4,100-202,140)

8. සමුද්‍ර පරිසර නිලධාරී (JM 1-2)- තනතුරු 03

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - කිලිනොච්චි, මඩකලපුව, ත්‍රිකුණාමලය

සුදුසුකම් :

බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිසර විද්‍යාව/ධීවර හා සාගර විද්‍යාව/ සමුද්‍රීය පරිසර කළමනාකරණය/වෙරළ සහ සමුද්‍රීය සම්පත් කළමනාකරණය /පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය/ව්‍යවහාරික විද්‍යාව/ජීව විද්‍යාව/සත්ව විද්‍යාව සහ ධීවර කටයුතු/ ස්වාභාවික විද්‍යාව/ ජෛව තාක්ෂණය/ ජලජ සම්පත් තාක්ෂණය/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන්ට අදාළ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.
2. අධිකාරියේ සහකාර සමුද්‍ර පරිසර නිලධාරී තනතුරක (MA 5-1) සේවා ගණයෙහි අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස :

අවු.22 ට නොඅඩු හා අවු.45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

JM 1-2 -2025 -රු.(74,010-10X1,360-18X2,040-124,330)

09. සහකාර සමුද්‍ර පරිසර නිලධාරී (MA 5-1)- තනතුරු 20

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ), වරාය කාර්යාලය (කොළඹ), කළුතර, මිගමුව, හලාවත, ගාල්ල, විදුහාරය (ගාල්ල), හම්බන්තොට, අම්පාර, ත්‍රිකුණාමලය, මඩකලපුව, මත්තාරම, කිලිනොච්චිය, යාපනය)

සුදුසුකම් :

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් පරිසර විද්‍යාව/ධීවර හා සාගර විද්‍යාව/ සමුද්‍රී පරිසර කළමනාකරණය /පරිසර සංරක්ෂණය සහ කළමනාකරණය/ව්‍යවහාරික විද්‍යාව/ජීව විද්‍යාව /සත්ව විද්‍යාව සහ ධීවර කටයුතු/ ස්වාභාවික විද්‍යාව/ ජෛව තාක්ෂණය/ ජලජ සම්පත් තාක්ෂණය/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම.

වයස :

අවු.22 ට නො අඩු හා අවු.45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

MA 5-1- 2025- රු.(58,740-10X1,190-15X1,360-11X1,670-109,410)

10. ලේකම් (MA 2-2)- තනතුරු 01

පුරප්පාඩු පවතින දිස්ත්‍රික්කය - ප්‍රධාන කාර්යාලය (කොළඹ)

සුදුසුකම්

බාහිර අයදුම්කරුවන්

ලේකම් තනතුරෙහි කාර්යභාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

තනතුරට විශේෂිත වෙනත් සුදුසුකම්

පරිගණක වදන් සැකසුම / යතුරුලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන්

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් අදාළ වේ.

වයස

අවු : 18 ට නොඅඩු හා අවු : 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වැටුප් පරිමාණය:

(2025.03.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව)

MA 2-2 - 2025 - රු.(50,540-10X540-7X630-4X1,080-20X1,280-90,270)

පොදු:

01. සෑම අයදුම්කරුවෙකුම,
    i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
    ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
    iii. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

02. සුදුසුකම් ලබන දිනය:

    සේවයට/තනතුරට පත් කිරීම සඳහා ඉල්ලුම් කිරීම පිණිස අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් අයදුම්පත් භාර ගත්තා අවසාන දින වන විට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර ඇත්නම් පමණි.

03. පත්වීමේ ස්වභාවය:

    තනතුර ස්ථිරය. සේවක අර්ථසාධක අරමුදල (EPF) වෙනුවෙන් සේවකයා විසින් ගෙවනු ලබන 10% ට අමතරව අධිකාරියේ 15% ක දායකත්වයක් සහ සේවක භාරකාර අරමුදල (ETF) වෙනුවෙන් 3% ක අමතර දායකත්වයක් ලබා දෙනු ලැබේ.

04. අයදුම්පත්‍ර එවීම:
    i. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ නිල වෙබ් අඩවියෙන් (https://mepa.gov.lk) භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාළ තනතුර සඳහා ඉල්ලුම් කළ යුතුය.
    ii. තනතුරු කිහිපයකට අයදුම්කරන අයදුම්කරුවන් එක් එක් තනතුර සඳහා අයදුම්පත් වෙන වෙනම ඉදිරිපත් කළ යුතුය.
    iii. මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්, ග්‍රාම නිලධාරි සහතිකය, පොලිස් වාර්තාව, ජාතික හැඳුනුම්පත, සියලුම අධ්‍යාපන සහතික, වෙනත් සුදුසුකම් සනාථ කරන සහතිකවල සහතික කරන ලද ඡායාපිටපත් අමුණා සම්පූර්ණ කළ අයදුම්පත් **2026.01.02** වෙනිදාට හෝ ඊට පෙර ලැබෙන පරිදි **සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය, අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05** වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණය සඳහා ජාතික හැඳුනුම්පත සහ ඉහත ඡායා පිටපත් මගින් ඉදිරිපත් කරන ලද සහතිකයන්හි මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය.
    iv. රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් ස්වකීය ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.
    v. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන, මූලික සුදුසුකම් නොමැති, අදාළ සහතික වල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොමැති හා නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලෙන් අස්ථානගත වන අයදුම්පත් පිළිබඳ අප අධිකාරිය වගකියනු නොලැබේ.

සභාපති, සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
අංක 177, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05.
2025.12.19

tamilguru.lk